**හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය - 2023**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්මේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1972 අංක 5 දරන ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන වලින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය, ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.3 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව,
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 හි 69 ඡේදයට පටහැනිව 2024 වර්ෂයේදී මිලදී ගත් රු. 1,804,500 ක් වටිනා වත්කම් හා ඒ සඳහා වූ රු.302,350 ක ක්ෂය වියදම් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කර තිබුණි. | පිළිගනිමි. | වර්ෂයට අදාල මිලදී ගැනීම් පමණක් ගිණුම් ගත කළ යුතුය. |
| (ආ) | පිරිවැය රු.71,753,647 ක් වූ සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද මෝටර් වාහන 20 ක් ආයතනය විසින් තවදුරටත් භාවිතා කරමින් පැවතියද ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 92 (ආ) ඡේදය අනුව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | පිළිගනිමි.<br>මෙම වර්ෂය තුල ඇස්තමේන්තු ගත වෙනස ගිණුම්ගත කිරිමට කටයුතු කරමි. | වත්කම් තක්සේරු කර ගිණුම් ගත කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිති අංක 11 ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ ප්‍රදානයන් වශයෙන් ලද රු. 4,298,900 ක් හා ඉකුත් වර්ෂවලදී ලද රු. 32,287,814 ක ශේෂය අයභාර ලෙස ගැලපීමට කටයුතු නොකර ප්‍රාග්ධන සංචිත ලෙස ගිණුම්ගත කර තිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත 11 හි 95 ඡේදය තව දුරටත් අධ්‍යනය කර අවශ්‍ය ගැලපුම් සිදු කරමි. | ප්‍රමිතය ප්‍රකාරව ප්‍රදානයන් ගිණුම්ගත කළ යුතුය. |

**1.5.2 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ ස්ථාවර වත්කම් අත්පත් කරගැනීම් රු. 4,594,039 ක් වුවද රු. 4,135,240 ක් ලෙස රු. 458,799 කින් වැඩියෙන් දක්වා තිබුණි. | පිළිගනිමි | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ නිවැරදි අගයන් සටහන් කළ යුතුය. |
| (ආ) | ලැබිය යුතු ශේෂයන්ගේ වෙනස රු. 5,604,410 ක් වුවත් රු. 782,510 ක් වූ අඩමාන ණය වෙන් කිරීම | ඉදිරියේදී විගණනය විසින් පෙන්වා දී ඇති පරිදි අදාල ගැලපීම් සිදු කරමි. | අඩමාන ණය වෙන් කිරීම ගැලපීමට පෙර ශේෂයන් මුදල් |

| | | | |
|---|---|---|---|
| | ගැලපීමෙන් පසු ශේෂයන්ගේ වෙනස ගණනය කර රු. 4,820,600 ක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දැක්වීම නිසා කාරක ප්‍රාග්ධනය රු. 782,510 කින් වැඩිවී තිබුණි. | | ප්‍රවාහ ප්‍රකාශයේ දැක්විය යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ මිල දී ගත් රු. 136,687 ක් වූ ජංගම නොවන වත්කමක් යන්ත්‍ර උපකරණ අලුත්වැඩියා වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | පිළිගනිමි. නිවැරදි කිරිමට කටයුතු කර ඇත. | ජංගම නොවන වත්කම් මිළදි ගැනීම් වත්කම් ලෙස ගිණුම්ගත කල යුතුය. |
| (ඈ) | 2020 පෙබරවාරි 07 දින සිට 2022 නොවැම්බර් දක්වා වී අලෙවි මණ්ඩලයේ උප සභාපති තනතුර සඳහා පත්කර තිබුණු මෙම ආයතනයේ ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරියා වෙනුවෙන් ඉහත සඳහන් කාලය සඳහා ගෙවන ලද රු. 4,256,574 ක වැටුප් හා දීමනා වී අලෙවි මණ්ඩලයෙන් ලැබිය යුතු මුදලක් ලෙස මුල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි. | අමාත්‍යාංශ ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් පැවති පාලක මණ්ඩල රැස්වීමේ දී ලබාදුන් අනුමැතිය පරිදි එම නිලධාරියා සේවා කාලයෙන් සියට 50 ක් සහ සියයට 90 ක් බැගින් 2020/02/07 දින සිට 2022/11/20 දක්වා සේවයෙන් නිදහස් කරන ලද අතර 2022/11/21 දින සිට 2023/11/30 දින දක්වා පූර්ණ කාලීනව නිදහස් කර තිබිණ. ප්‍රතිපූර්ණ නොකළ කාල සීමාව සඳහා අමාත්‍යාංශයේ විගණන කමිටුවේ උපදෙස් පරිදි ප්‍රතිපූර්ණය කිරිමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | අයවිය යුතු මුදල් කඩිනමින් අයකර ගැනීම සඳහා කටයුතු කළ යුතුය. |

### 1.5.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රු. 27,607,208 ක් වූ ලී බඩු හා කාර්යාල උපකරණ, රු.34,413,533 ක් වූ පරිගණක උපකරණ හා රු.49,701,404 ක් වූ ගොඩනැගිලි සඳහා විස්තරාත්මක උපලේඛන විගණනයට ඉදිරිපත් නොවීය. | පවතින විස්තරාත්මක තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් කර ඇති අතර මෙම වර්ෂයේදී මෙම වත්කම් ප්‍රත්‍යාගණනය කර නැවත ප්‍රත්‍යාගනන වටිනාකම් ගිණුම්ගතකර උපලේඛණ යවත්කාලීන කිරිමට කටයුතු කරමි. | ස්ථාවර වත්කම් සනාථ කර ගැනීම සඳහා විස්තරාත්මක උපලේඛන ගිණුම් සමඟ ඉදිරිපත් කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 අගෝස්තු මස ආයතනයෙන් ඉවත්ව ගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.5,272,016 ක මුදල අයකර ගෙන නොතිබුණි. | 2021 අගෝස්තු 23 දින නැගෙනහිර විශ්ව විද්‍යාලයේ කථිකාචාර්ය තනතුරක් සඳහා ආයතනයෙන් ඉවත් ව ගිය ඊ.ඒ.සී.ප්‍රියංකර මහතාගෙන් අයවිය යුතු රු. 5,272,016 ක මුදල ලබා ගැනීම | අදාළ නිලධාරියාගෙන් ආයතනයට අයවිය යුතු මුදල් කඩිනමින් |

| | | | |
|---|---|---|---|
| | | සඳහා නීතිපති දෙපාර්තමේන්තුව හරහා නඩු කටයුත්ත ආරම්භ කර ඇත. නඩුව සඳහා අදාළ ලියකියවිලි මේ වන විට සම්පූර්ණ කර ඇත. | අයකර ගත යුතුය. |
| (ආ) | රු. 17,965,464 ක් වූ විදේශ ශිෂ්‍යත්ව ණයගැති ශේෂයෙන් රු. 12,693,448 ක මුදලක් හා රු. 24,387,625 ක් වූ අනෙකුත් ණයගැති ශේෂයෙන් රු. 2,192,602 ක ශේෂයක් වර්ෂ 05 කට වැඩි කාලයක සිට අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද රු.28,959,096 ක් වූ ගෙවිය යුතු ගිණුම් ශේෂයෙන් රු.2,365,048 ක ශේෂයක් වර්ෂ 05 කට වැඩි කාලයක සිට නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | 2002 වර්ෂයට පෙර පැවත එන ශේෂය වූ රු. 12,693,448 ක මුදල විදේශ ශිෂ්‍යත්ව ණයගැතියන් 06 දෙනෙකුගෙන් අයකර ගැනීමට ඇත. ඔවුන් ගෙන් තිදෙනෙකුගේ නඩු කටයුතු අවසන් වී ඇති අතර නඩු තීන්දු අනුව ආයතනයට අදාළ මුදල් ගෙවීම සඳහා ශිෂ්‍යත්ව ණයගැතියන්ට නියම කොට ඇත. ඒ සඳහා අවශ්‍ය සමථයක් හෝ දේපළ මගින් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. ඉතිරි තිදෙනාගේ විදේශ ලිපිනයන් සොයා ගැනීමට නොහැකි වීම මත නඩුව ඉදිරියට ගෙන යාමට නොහැකි වී ඇත. කෙසේ වුවද මෙම තිදෙනාගේ ඥාතීන් මාර්ගයෙන් අදාළ ශිෂ්‍යත්ව ණයගැතියන් සම්බන්ධ කර ගැනීම සඳහා කටයුතු සිදු කරමින් පවතී. | නඩු තීන්දු අනුව ණය මුදල් අයකර ගත යුතු අතර ඉතිරි ණය ශේෂද කඩිනමින් නිරවුල් කර ගත යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | **නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 104(2)(ආ) | 2011 වර්ෂයේදී රු. 1,067,150 ක වැයකර ආරම්භ කළ ජීව වායු ව්‍යාපෘතිය 2016 වර්ෂයේ සිට අක්‍රීය වී තිබුණු අතර 2022 ජුනි 23 දින ඉදිරිපත් කළ පරීක්ෂණ වාර්තාව අනුව හිටපු අධ්‍යක්ෂකවරයා විසින් ටෙන්ඩර් පටිපාටිය උල්ලංඝනය කර එම ව්‍යාපෘතියට අවශ්‍ය අමතර කොටස් මිළදී ගෙන යෙදීම හා අනෙකුත් නිලධාරීන්ද සම්බන්ධ කරගෙන එහි ක්‍රියාකාරිත්වයට බාධා වන පරිදි ක්‍රියාකර ඇති බවට නිගමනය කර ඇතත් සිදුවූ එම අලාභයන් අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි. | අදාළ ජීව වායු ව්‍යාපෘතිය පිළිබඳව මු.රෙ. 104 පරීක්ෂණය සිදුකර ඇති අතර ඊලඟ විගණන හා කළමනාකරණ කමිටුව වෙත යොමු කර ඉදිරි ක්‍රියා මාර්ග ගැනීමට කටයුතු කරනු ලැබේ. | මු.රෙ. පරීක්ෂණය අනුව සිදුවූ එම අලාභයන් අයකර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික | රාජ්‍ය සේවයෙන් ලබා ගත් පුහුණුව භාවිතා කරමින්, කාර්යාල | ව්‍යාපෘතියේ ඇස්තමේන්තු ගත අයවැය පාලක මණ්ඩලය වෙත | ආයතන සංග්‍රහයේ විධි විධානයන්ට |

| | | | | |
|---|---|---|---|---|
| | සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ IX පරිච්ඡේදයේ 2.2 වගන්තිය | වේලාවන් තුලම කරනු ලබන වැඩ වෙනුවෙන් නිලධාරියාට පෞද්ගලික වනලෙස ගෙවනු ලබන ගාස්තු වෙනුවෙන් සියයට 25 ක් ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු වුවත් 2017 සිට 2022 දක්වා ආයතනයේ නිලධාරීන් 38 දෙනෙකුට රු. 3,707,770 ක දීමනා ගෙවා ඇතත් ඒ සඳහා වූ රජයේ දායකය වූ රු. 926,943 ක් අඩුකර ඒකාබද්ධ අරමුදලට බැර කර නොතිබුණි. | ඉදිරිපත් කරනු ලබයි.එම ඇස්තමේන්තු ගත අයවැය තුළ පර්යේෂණ සඳහා යන වියදමෙන් සියයට 7 - සියයට 15 දක්වාවූ ප්‍රතිශතයන්ගෙන් යුත් අගයක් පරිපාලන වියදම් ලෙස ඇතුලත් කරනු ලබයි. මෙම ව්‍යාපෘතින් අවසන් කිරීමෙන් පසු ශේෂ මුදලක් පවතිනම් එම ශේෂය රාජ්‍ය මුල්‍ය චක්‍රලේඛ 01/2020 ප්‍රකාරව බෙදාහැරීම සිදුකරනු ලබයි.මෙම ශේෂය බෙදාහැරීමේදි රාජ්‍ය මුල්‍ය චක්‍රලේඛ 01/2020 හි II කොටසේ 7.2 ඡේදය යටතේ දක්වා ඇති පරිදි පාලක මණ්ඩල අනුමැතියට යටත්ව ගෙවීම් සිදුකරනු ලබයි. මෙහිදි අදාළ ඍජු හා වක්‍ර දායකත්වය දැක්වූ සේවකයින්ට සියයට 75 ද නැවත පොදුකාර්යය වියදම් ලෙස සියයට 5 ද ආයතනයේ දායකත්වය සියයට 20 ද ලෙස ශේෂය බෙදාහැරීම සිදුකරනු ලබයි. | අනුව පෞද්ගලික වන ලෙස ලබා දෙන ගාස්තුව වෙනුවෙන් සියයට 25 ක් ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 6.3 වගන්තිය | ලේඛකාධිකාරී විසින් ආයතන සංග්‍රහයට පටහැනිව තම නිල නිවසේ කාමර පෞද්ගලික පාර්ශවයන්ට ලබාදීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කර ඔවුන්ගේ නිර්දේශ අනුව කටයුතු කළ යුතු බව මුදල් රෙගුලාසි 104 පරීක්ෂණ වාර්ථාවෙහි දක්වා තිබුණ ද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | අමාත්‍යාංශ ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් පැවති විගණන හා කළමනාකරණ කමිටුව වෙත යොමුකරන ලද අතර එහිදී ලබාදුන් උපදෙස් අනුව අවශ්‍ය විනය ක්‍රියා මාර්ග ගෙන ඇති බැවින් නැවත එම සිද්ධිය පිළිබඳව පාලක මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම අවශ්‍ය වී නොමැත. | විනය ක්‍රියා මාර්ගය ක්‍රියාත්මක කර එය පෞද්ගලික ලිපි ගොනුවට ඇතුලත් කළ යුතුය. |
| (ඈ) | 2022 ජනවාරි 25 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 04/2022 | 2022 වර්ෂයේ වාර්ෂික සමීක්ෂණ වාර්තා අනුව අංක 141 – 5655, 141 – 5672 හා 141 – 5646 දරන වාහන අපහරණය සඳහා යොමුකර ඇතත් 2023 දෙසැම්බර් 31 දින වන විටත් අපහරණ කටයුතු සිදුකර නොතිබුණු අතර වර්ෂ 05 කට වැඩි කාලයක සිට ධාවනයෙන් ඉවත් කර තිබුණු අංක 32 – 4670 හා 30 – 4342 | යතුරු පැදි අපහරණය සඳහා පත් කරන ලද කමිටුවේ වාර්තාව ලද විගස අපහරණ කටයුතු සිදු කිරීමට කටයුතු කරනු ලැබේ.<br>අංක 32-4670 හා 30-4342 ජීප් රථ අලුත්වැඩියාව සඳහා යෝජිතව පැවතිය ද ප්‍රමාණවත් මුල්‍ය ප්‍රතිපාදන නොමැතිවීම හේතුවෙන් අලුත්වැඩියා | අපහරණ සහ අලුත්වැඩියා කටයුතු කඩිනමින් සිදු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | දරන ජීප් රථ 02 අලුත්වැඩියාවට යෝජිතව පැවතියද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අලුත්වැඩියා කර ඵලදායී ලෙස යොදා ගැනීමට කටයුතු කර නොතිබුණි. | කළයුතු සිදු කිරීම ප්‍රමාද වී ඇත. ලබාගත හැකි මූල්‍ය ප්‍රතිපාදාන මත අලුත්වැඩියා කටයුතු සිදු කිරීමට අපේක්ෂා කෙරේ. | |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ ආයතනයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 16,128,359 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 5,391,622 ක් වීමෙන් ඉකුත් වර්ෂය හා සසඳන විට සමාලෝචිත වර්ෂයේ රු. 10,736,737 ක අතිරික්තයේ වැඩිවීමක් නිරීක්ෂණය විය. ආදායම රු.29,141,960 කින් වැඩිවීම හා සේවක පාරිශ්‍රමික වියදම රු. 18,308,563 කින් අඩුවීම මෙම මූල්‍ය ප්‍රතිඵලයහි වර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 2.2 අනුපාත විශ්ලේෂණය

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ජංගම අනුපාතය සියයට 2.26 ක අඩුවීම හා ක්ෂණික වත්කම් අනුපාතය සියයට 0.24 කින් වැඩිවීම සිදුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ලෝක ආහාර සංවිධානයෙන් පරිත්‍යාගයක් ලෙස ලද අංක 40 – 3933 දරන ලොරි රථය විගණිත දිනය වූ 2023 දෙසැම්බර් 31 දින දක්වාම ආයතනය වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ලෝක ආහාර දෙපාර්තමේන්තුව වෙත ඒ බැව් දන්වා ඇති අතර එම ආයතනය විසින් ලොරි රථය පවරා දීමට අවශ්‍ය කටයුතු සිදු කරගෙන යන බව දන්වා ඇත. | රථය පවරා ගැනීම කටයුතු කඩිනම් කළ යුතුය |
| (ආ) | 2020 පෙබරවාරි 07 දින සිට 2022 නොවැම්බර් දක්වා වී අලෙවි මණ්ඩලයේ උප සභාපති තනතුර සඳහා පත්කර තිබුණු මෙම ආයතනයේ ජ්‍යොෂ්ඨ පර්යේෂණ නිලධාරියා වෙනුවෙන් ඉහත සඳහන් කාලය සඳහා ගෙවන ලද රු. 4,256,574 ක වැටුප් හා දීමනා වී අලෙවි මණ්ඩලයෙන් ලැබිය යුතු මුදලක් ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි. | අමාත්‍යාංශ ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් පැවති පාලක මණ්ඩල රැස්වීමේ දී ලබාදුන් අනුමැතිය පරිදි අදාළ නිලධාරියා සේවා අවශ්‍යතාවය මත වී අලෙවි මණ්ඩලයට නිදහස් කර ඇති අතර එම නිලධාරියා සේවා කාලයෙන් සියයට 50 ක් සහ සියයට 90 ක් බැගින් 2020/02/07 දින සිට 2022/11/20 දක්වා සේවයෙන් නිදහස් කරන ලද අතර 2022/11/21 දින සිට 2023/11/30 දින දක්වා පූර්ණ කාලීනව නිදහස් කර තිබිණ. 2021/11/21 දින සිට 2023/11/30 දින දක්වා කාලය සඳහා ගෙවන ලද වැටුප ප්‍රතිපූර්ණය කිරීමට කටයුතු කර ඇති අතර ප්‍රතිපූර්ණ නොකළ කාල සීමාව සඳහා අමාත්‍යාංශයේ විගණන කමිටුවේ උපදෙස් පරිදි ප්‍රතිපූර්ණය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | අයවිය යුතු වැටුප් හා දීමනා කඩිනමින් ලබාගැනීමට කටයුතු කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2019 මැයි 02 දිනැති ප්‍රධාන පොත් ගබඩාවේ අපහරණය කළ යුතු පොත් හඳුනාගැනීමට පත්කරන ලද කමිටු වාර්තා අනුව රු. 2,191,598 ක් වටිනා පොත් 12,475 ක් ඉවත් කළ යුතු බව දක්වා තිබුණද 2023 දෙසැම්බර් 31 දින වන විටත් අවශ්‍ය ක්‍රියාමාර්ග නොගැනීම හේතුවෙන් එම පොත් වේයන් කා දිරාපත් වෙමින් පැවතුණි. | අදාළ කමිටු වාර්තාව ලැබුණු වහාම පාලක මණ්ඩලය වෙත එහි නිර්දේශ ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීමෙන් පසුව ඉදිරි කටයුතු කිරීමට නියමිතව ඇත. | අපහරණ මණ්ඩල තීරණ කඩිනමින් සිදු කළ යුතුය. |